රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.197(IV).

මගේ අංකය: 543ඊ708 බී.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1982 මාර්තු මස 26 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි.

**වැටුප් සමාලෝචන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම - අංක 197 හා 1981.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන.**

---

01. 1 පරිශිෂ්ටයේ:

(අ) "ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරු ... ... ... 17:01" කපාහැර,
"ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරු ... ... ... 22" ආදේශ කරන්න.

(ආ) "පොදු ශ්‍රේණි" යටතේ,
"III පන්තිය ... ... ... 01:02" කපාහැර,
"III පන්තිය ... ... ... 01:01" ආදේශ කරන්න.

(ඇ) "මෝටර් වාහන ශෝධකවරු ... ... ... 01:03" කපාහැර,
"මෝටර් වාහන ශෝධකවරු ... ... ... 01:04" ආදේශ කරන්න.

02. 01:02 වැටුප් ක්‍රමය අදාළ වනුයේ වෘත්තියාභිවෘද්ධි වැටුප් පරිමාණයක ප්‍රතිලාභ ලබා නුපුහුණු කම්කරුවන්ටය. (නව III පන්තිය). (V පරිශිෂ්ටය බලන්න.)

03. III වැනි පරිශිෂ්ටයේ සඳහන්ව ඇති "සියලු දීමනා සහිත යෝජිත වැටුප" යටතේ ඇති දෛනික වැටුප්, 1982.01.01 දින සිට රුපියල් 30 ට අඩු දෛනික වැටුප් ලබාගන්නා <u>සේවකයින් වෙනුවෙන් පමණක්</u> පහෙන් එකකින් (1/5) වැඩි කළ යුතුය.

04. දෛනික වැටුප් ගෙවීමේදී:

(අ) දින පහක් හෝ දින හයක් හෝ දින හතක් වැඩකරන සේවකයෝ අතර ද,
(ආ) පිරිමි සහ ගැහැණු සේවකයෝ අතර ද,
(ඇ) කෘෂිකර්ම සහ ක්ෂේත්‍ර සේවකයෝ සහ ඉංජිනේරු සහ කාර්මික සේවකයෝ අතර ද,
(ඈ) කොළඹ සහ පිට පළාතක වැඩ කරන සේවකයෝ අතර ද,

කිසියම් වෙනසක් නොවන්නේය.

05. 1982.01.01 දින සිට මාණ්ඩලික නිලධරයකු වන්නේ, මූලික නව ඒකාබද්ධ වාර්ෂික වැටුප රු.13,800 ක් වූ හෝ ඊට වැඩිවුන්, වාර්ෂික වැටුප් වර්ධකය රු.480 ක් වූත්, ඊට වැඩිවුත් රජයේ නිලධරයකු ය.

Siriwardhana

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.

රණ/26.